# Farm - වැඩ සටහන

# කුඩා ජල පෝෂිත කළමණාකරණය

**මිනිසා සහ පරිසරය අතර ඇති සබැඳියාව පිළිබඳ විවාදයන් ගණනාවක් පසුගිය කාලය පුරාම පැවතිනි. වැඩිවන ජනගහන තදබදයත් සමඟම මිනිසා සහ ජනගහනය අතර වූ ස්වාභාවික තුලනය තර්ජනයට ලක් වී තිබේ.** පවත්නා ස්වාභාවික සහ කෘෂිකාර්මික සම්පත් හි නිෂ්පාදන ධාරිතාවය පිළිබඳව කෘෂි ක්ෂේත්‍රයේ විද්වත් අවධානය යොමු වී ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධන ප්‍රයත්නයන්ගේ නවීන වාරිමාර්ග ව්‍යාපාර ඉදි නොවූ, එම අංශයෙන් අඩු ප්‍රතිලාභයක් අත් වී ඇති වර්ෂාපෝෂිත ප්‍රදේශයන් හි, මෙම තත්ත්වය ඉතාමත්ම බරපතලය. **ආසියාවේ දිළින්දන්ගෙන් සියයට 60 ප්‍රතිශතයක් ජීවත් වන්නේ සුළු පරිමාණ වර්ෂාපෝෂිත කෘෂිකාර්මික ප්‍රදේශයන්හි ය.** වනාන්තර හෙළීම පුළුල් වීමෙන්, ජෛව විවිධත්වය විනාශ වීමෙන්, ජල සහ ඉඩම් සම්පත් හීනවීමෙන් ග්‍රාමීය හා නාගරික ආදයම් පරතරය තරක අතට හැරීමෙන් වර්ෂා පෝෂිත ආසියාතු ප්‍රජාවන් හි සහ ගෘහස්ථයන් හි අනාගත ජීවිකාවන් හා සමාජමය පසුතලය පරිහාණියට ලක්වීමේ තර්ජනයක් ඇති වී තිබේ.

> **වැඩිවන ජනගහන තදබදයත් සමඟම මිනිසා සහ ජනගහනය අතර වූ ස්වාභාවික තුලනය තර්ජනයට ලක් වී තිබේ.**

## සම්පත් කලමනාකරණ වැඩසටහන

**එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුව නොහොත් මිහිකත සමුළුවේ දී පිළිගත් ක්‍රියාත්මක සැලැස්ම වන න්‍යාය පත්‍ර 21 ක්‍රියාවට නැංවීමට දයක වෙමින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන විසින් 1991 /92 ගොවිජනතාව කේන්ද්‍ර කොටගත් කෘෂි සම්පත් කළමනාකරණ (FARM) වැඩසටහන මුලින්ම නිර්මාණය කරනු ලැබ ඇත.** න්‍යාය පත්‍ර 21 අමතන ලද්දේ මිනිස් ක්‍රියාවන් හේතුවෙන් පරිසරයට වන්නා වූ බලපෑම පදනම්ව සියළුම මානව ආර්ථික ක්‍රියාකාරකම් වෙනස් කිරිම සඳහාය. **දුප්පත්කම අඩු කිරිම, බඩගින්න සහ අනෙකුත් මූලික සමාජීය ප්‍රශ්නයන් අඩු කරන අතරම පරිසරය ආරක්ෂා කර ගනිමින් තිරසාර සංවර්ධනයක් ඇති කර ගැනීම මෙහි පුළුල් අභිමථාර්තයයි.**

සංවර්ධන දර්ශනයක් දිශානති වූ **ෆාම්** වැඩසටහනේ ප්‍රවේශය වී ඇත්තේ ගොවිජනතාව කේන්ද්‍ර කොටගත් ඒකාබද්ධ සහභාගිත්ව කෘෂිකාර්මික සංවර්ධන මාදිලියක් වේ. ඉහත සඳහන් කළ ග්‍රාමීය සංවර්ධනය සඳහා ඉදිකළ වාරිමාර්ග ව්‍යාපාර අඩු වර්ෂා පෝෂිත ප්‍රදේශයන් හි ඉඩම්, ජලය සහ වන සම්පත් කලමනාකරණය කරනු ලබන්නේ ඒවායේ ජීවත්වන දශලක්ෂ ගණනක් වූ ග්‍රාමීය ප්‍රජාව විසිනි. ගොවි ගෘහස්ථ සඳහා හොඳ පරිසරයක් නිර්මාණය කිරීම හා ගොවි ප්‍රජාව සවිබල ගැන්වීම, තිරසාර සංවර්ධනය වැඩි වර්ධනය කිරීම සඳහා සම්පත් කලමනාරණය කිරීමේ තීරණ ගැනීම, සම්පත් නිර්මාණාත්මක භාවිතය සහ ඔවුන්ගේ දේශීය ඥානය උකහා ගැනීම සඳහා මෙහි දී අවධානය යොමු වී තිබේ. විශේෂයෙන්ම දුර්වල ආන්තික පරිසර පද්ධති තුල සම්පත් හායනය සහ දුප්පත්කම අතර ඉතා විශාල සමීප සම්බන්ධතාවයක් ඇති බවට නව අදහසක් ජනිත වී ඇත. සාමාන්‍ය අදහස වී ඇත්තේ මෙම ගැටළු විසඳිය යුත්තේ එකවිටම තිරසාර ලෙස සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමයක් භාවිතා කරමිනි. එවැනි සංකීර්ණ සංවර්ධන අභියෝගයන් බෝග වර්ග පදනම් කර ගනිමින් හෝ විෂයයන් පදනම් කර ගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධනය හා ව්‍යාප්ති කටයුතු වලදී ඒවාටම ආවේනික වූ සීමාවන් දැකිය හැකිය. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් හි "**සෙත සැලසෙන්නන් කාන්තාවන් ය.**" යන චින්තනය කෘෂිකාර්මික සම්පත් වඩාත් හොඳින් කලමනාකරණ තීරණය

> **දුප්පත්කම අඩු කිරීම, බඩගින්න සහ අනෙකුත් මූලික සමාජීය ප්‍රශ්නයන් අඩු කරන අතරම පරිසරය ආරක්ෂා කර ගනිමින් තිරසාර සංවර්ධනයක් ඇති කර ගැනීම මෙහි පුළුල් අභිමථාර්තයයි.**

ගැනීමට කාන්තාවන්ට සහාය වීමක් දෙසට වෙනස් වී තිබේ.

## අභිමතාර්ථයන් සහ සැලැස්ම

මූලික වශයෙන්ම මෙම වැඩසටහනේ සංවර්ධන අභිමතාර්ථයන් වශයෙන් දක්වා ඇත්තේ තිරසාර සංවර්ධනය සහ සමානාත්මතාවය සඳහා සහභාගිත්ව ප්‍රවේශයන් තුලින් වර්ෂාපෝෂිත ප්‍රදේශයන් හි ස්වාභාවික සම්පත් නිසිලෙස භාවිතා කිරීම කලමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම උදෙසා ආසියාතික කලාපයේ සම්පත් හිඟ ප්‍රජාවගේ සහ ගොවීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්හි හැකියාවන් පුළුල් කිරීම" යි.

**බොහෝ ආසියාතු කෘෂිකාර්මික සම්පත් හි සත්‍ය කලමනාකරුවන් වන්නේ බිලියන බාගයකට කිට්ටු තනි තනි ගොවි ගෘහස්ථයන් ය.**

**ෆාම් වැඩ සටහනෙහි දක්ම වන්නේ "ආසියාතු කලාපයේ වර්ෂා පෝෂිත ප්‍රදේශයන් හි ජනතාව ස්වභාවික හා කෘෂිකාර්මික සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීමට දායක වීම තුලින් ප්‍රජාවගේ ආහාර සුරක්ෂිත භාවය සහ සම්පත් ආරක්ෂා කිරීම" යි.**

## ෆාම් වැඩ සටහනෙහි නිමැවුම

ෆාම් වැඩ සටහනෙහි ප්‍රධානතම නිමැවුම වන්නේ ගොවිජන ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවකරුවන් අතර ඒකාබද්ධ සහ සහභාගිත්ව වැඩ කිරීමේ ප්‍රවේශයන් පිළිබඳව ආදර්ශනයන් පර්යේෂණයට භාජනය කිරීමයි. ඊට අමතරව මෙම වැඩසටහන මඟින් සිදුකරන්නේ "**තිරසාර ගොවිපල ක්‍රම**" **(Farming System)** සඳහා තාක්ෂණයන් ඉපැද්දවීම, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන් හි සහභාගිත්වයෙන් තිරසාර කෘෂිකාර්මික සම්පත් කලමනාකරණයක් සඳහා ආදර්ශනයන්, ගොවීන් සහාය සංවිධානයන් සහ රටවල් අතර තොරතුරු හුවමාරුව, ප්‍රාදේශීය කාර්ය මණ්ඩල, ප්‍රජා නායකයින්, සඳහා පුහුණු, රාජ්‍ය නොවන සංවිධාන ගොවීන් සහ සංවිධානය වූ ගොවි කණ්ඩායම් වලට සහාය සේවාවන් සඳහා වඩා හොඳ සම්බන්ධයක් ඇති කිරීමත්ය.

## ෆාම් වැඩ සටහනේ මූලිකාංග

තිරසාර කෘෂිකාර්මික සම්පත් කලමනාකරණයක් සහ ගොවි ප්‍රජාවන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන් හා රාජ්‍යයන් අතර ද විද්‍යාඥයන් සහ ගොවීන් අතර ද කොටස්කාරී බවක් ඇති කිරීම මාර්ගයෙන් ග්‍රාමීය වර්ෂාපෝෂිත ප්‍රදේශයන් ගේ ගෘහස්ථයන් හි ආහාර සුරක්ෂිතභාවය ලබා ගැනීමට ෆාම් ප්‍රවේශයේ සහාය වඩා වර්ධනය කරයි. ප්‍රදේශයේ පවත්නා සංවිධාන සහ ප්‍රජා සහයෝගීතාවය මෙම වැඩසටහනින් අවධාරණය කරයි. කෙසේ වුවත්, වඩාත් වැදගත්ම කොටස්කාරත්වය වන්නේ ගොවීන්, ව්‍යාප්ති සේවකයන් සහ විද්‍යාඥයින් අතර වේ.

**බොහෝ ආසියාතු කෘෂිකාර්මික සම්පත් හි සත්‍ය කලමනාකරුවන් වන්නේ බිලියන බාගයකට කිට්ටු තනි තනි ගොවි ගෘහස්ථයන් ය.** ගොවි ප්‍රජාවේ ස්ත්‍රී - පුරුෂයන් සහ ඇතැම් විට ළමයින් බෝග වර්ග සම්බන්ධයෙන්, ආහාර පාරිභෝජනය, සතුන් පෝෂ්‍ය කිරීම, දර එකතු කිරීම සහ බොහෝ වෙනත් තීරණාත්මක කටයුතු සම්බන්ධව අනාගත ස්වාභාවික සම්පත් පදනම මත දිනපතා තීරණ ගනු ලබයි. ගොවි ගෘහස්ථයේ සම්පත් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ නිෂ්පාදනය සහ පාරිභෝජනය යන ඒකක දෙකම වැදගත් ලෙස සලකා **ෆාම්** උපාය මාර්ගයන්හි ක්‍රියාත්මක කරයි.

## සහභාගිත්වය සහ කොටස් කාරත්වය :

සංවර්ධන ප්‍රජාවන් හි මහජන සංවිධාන, පෞද්ගලික සංවිධාන, ප්‍රදේශයේ සංවිධාන සමඟ සහයෝගය ෆාම් වැඩසටහන අවධාරණය කරයි. කෙසේ වුවද, මෙම වැඩසටහනේ වඩාත්ම වැදගත් කොටස් කාරත්වය වන්නේ විද්‍යාඥයින්, ව්‍යාප්ති සේවකයින් සහ ගොවීන් අතර ය. **බොහෝ ආසියාතු කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානයන් විසින් පර්යේෂණ විවර හඳුනාගෙන තිබේ.** මේ වැඩසටහන එම අඩුව පිරිමසන පාලමක් කිරීමේ බලාපොරොත්තු පවතී.

**බොහෝ ආසියාතු කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානයන් විසින් පර්යේෂණ විවර හඳුනාගෙන තිබේ.**

## ස්ත්‍රී - පුරුෂ සමානතාවය

**(gender equity)** නොමැතිව සහභාගිත්ව සහ කොටස් කාරත්ව ප්‍රවේශය අසීරුය. මෙම නිසා මූලික අවශ්‍යතාවයන් ලෙස **පාම්**

**ගොවි පළපුරුද්ද සහ දැනුම, නිර්මාණාත්මකභාවය සහ තමන්ගේම සම්පත් අත්‍යවශ්‍ය යෙදවුම් වේ.**

වැඩ සටහනේ සියළුම මට්ටම් වලදී ස්ත්‍රී පුරුෂ සමානභාවය සංයෝග කර තිබේ. දැනුවත් බව වැඩි කිරීම, අධ්‍යාපනය, පුහුණුව යන ඒවා ඉතා වැදගත් සහාය කාර්යයන් වන්නේ එබැවිනි.

## තිරසාර වර්ධනය :

**ග්‍රාමීය ප්‍රදේශයන් හි තිරසාර සංවර්ධනය ලෙස සැලකෙන්නේ ඉඩම්, ජලය, වනාන්තර සහ ජෛව විවිධත්වය යන සම්පත් පරිසරාත්මක හායනයට පත් නොකර, තාක්ෂණිකව යෝග්‍ය වීමත්, ආර්ථිකමය වශයෙන් හැකියාවක් තිබීමත් සහ සමාජීය වශයෙන් පිළිගන්නා තත්වයක් පැවැතීමත්ය.** ජනගහනය පුළුල් වෙද්දී සහ අවශ්‍යතාවයන් වෙනස් වෙද්දී වැඩිවන අවශ්‍යතාවයන් සඳහා ඒවා ඉටුකර දීමට එවැනි ආර්ථිකයක් ක්‍රියාශීලි විය යුතුය. පුළුල් විවිධ ආංශික සහ අන්තර් විෂයානුගත එළඹුමක වාසිය වන්නේ වැඩසටහන සඳහා තිරසාර කෘෂිකාර්මික සම්පත් කලමනාකරණය පිළිගෙන තිබීම සහ ආයතනිකකරණයට සහාය වීමයි. **පාම්** වැඩසටහන භාවිත කරන ක්‍රම සහ සහභාගීත්ව ක්‍රම, සිරස් සංවර්ධන පසුබිමක් සුරක්ෂිත කිරීමට **ගොවි පළපුරුද්ද සහ දැනුම, නිර්මාණාත්මකභාවය සහ තමන්ගේම සම්පත් අත්‍යවශ්‍ය යෙදවුම් වේ.**

වෙනස්, වෙනස් විෂයයන් හි ඒකාබද්ධතාවය, පළපුරුද්ද ඇති ක්ෂේත්‍ර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හා සැලසුම් කිරීමේ මූලික සිද්ධාන්ත වෙයි. මේ මාර්ගයේ පර්යේෂණ සහාය සේවා සහ ප්‍රතිපත්ති, ගොවි ගෘහස්ථයන් හි සත්‍යතාවය සහ සංවර්ධනය ප්‍රතිපත්තියේ බලපෑම පිළිබිඹු කිරීමට හැකිය.

### පාම් සංවර්ධන උපාය මාර්ගය

**සම්පත් කළමණාකරණය සහ කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සංවර්ධන වෘත්තිකයන් ඔවුන්ගේ එළඹුම් පිළිබඳව යළි සිතන්නට පටන්ගත් ද සිට එළිදක්වන ලද හා සොයාගත් නව ක්‍රම ගණනාවක් පාම් වැඩ සටහනෙහි අන්තර්ගත කර තිබේ.** පුනර්ලෝකනය මගින් තිපත් .නව චින්තනයක් පහත දක්වා ඇති අයුරින් නිෂ්පාදන සංවර්ධන එළඹුමකින් තිරසාර සංවර්ධන එළඹුමකට මාරුකර ඇත.

**පාම්** සංවර්ධන එළඹුම වන්නේ වර්ෂාපෝෂිත ප්‍රදේශයන්ට ප්‍රමුඛත්වය දීම, ජනතා සහභාගිත්වය, තිරසාර සම්පත් භාවිතය, විවිධ විෂයානුගත සහ පද්ධති එළඹුම්, ස්වශක්තිය ප්‍රජා තීරණ සහ පාලන, ස්ත්‍රී පුරුෂ

**සම්පත් කළමණාකරණය සහ කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සංවර්ධන වෘත්තිකයන් ඔවුන්ගේ එළඹුම් පිළිබඳව යළි සිතන්නට පටන්ගත් ද සිට එළිදක්වන ලද හා සොයාගත් නව ක්‍රම ගණනාවක් පාම් වැඩ සටහනෙහි අන්තර්ගත කර තිබේ.**

සමානත්වය සහ ස්ත්‍රීන්ට කොටස්කාර වැඩ කොටසක් සහිත ඒකාබද්ධ සහ ජාල එළඹුමකි.

**මෙම චින්තාව හඳුන්වන්නේ විවිධ මුහුණුවරකින් යුත් එළඹුමක් සඳහා ජාල කලමනාකරණ සහ පුළුල් සහ නම්‍යශීලී සංවර්ධන සහායක මාදිලියක් ලෙසිනි.** මේ ආකාරයට බොහෝ ආණ්ඩු සහ ආධාර ආයතන ගමන් කරන්නේ වැඩසටහන් ප්‍රවේශයක් වෙතට වීම සැළකිය යුතුය. **පාම්** වැඩසටහන එවැනි වැඩසටහනක් සඳහා එක උදාහරණයකි.

**පාම්** වැඩසටහන සඳහා සම්බන්ධීකරණය කරන ලද්දේ කෘෂිකර්ම අමාත්‍යාංශයයි. වැඩසටහනෙහි එක් එක් අංග ක්‍රියාත්මක කිරීමට භාර වූ වෙනත් ආයතන නම් **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණායතනය, උතුරු මැද පලාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය, ස්වාභාවික සම්පත් කලමනාකරණ ආයතනය, බණ්ඩාරවෙල බිඳුනුවැව පර්යේෂණායතනය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** යන ආයතන වේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලද ක්ෂේත්‍රය වූයේ **තිරප්පනේ** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ **මානක්කුලම** ග්‍රාම නිළධාරී වසමයි.

වැඩසටහන හා සම්බන්ධිත සියළුම ආයතනවල සහභාගීත්වයෙන් සහභාගීත්ව ක්‍රමවේද භාවිතා කරමින් මේ පිළිබඳව මූලික සමීක්ෂණයක් සිදුකර ගමේ සම්පත් ගැටළු සහ විභවතාවයන් හඳුනා ගනු ලැබුණි. **පාම්** වැඩසටහන සඳහා වූ දර්ශනයට අනුව හා එහි මූලිකාංග වලට අනුකූල වන සේ සහ එහි මූඛ්‍යාර්ථය කුළුගැන්වෙන ආකාරයට මෙම ආයතනයන් විවිධ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක කොට තිබේ.

**දෙඩම් හා ජම්බෝල වැනි සෙසු පැහිරි වර්ග බද්ධ කිරීම සඳහා කුඩළු දෙඩම් බීජ බණ්ඩාරවෙල ප්‍රදේශීය කෘෂි කර්ම පර්යේෂණ මධ්‍යස්ථානය මගින් නිපදවයි.**

## පස් වැටි ඉදි කිරීම

පසේ තෙතමනය රඳා පැවතීම, භූගත ජල මට්ටම ආරක්ෂා කිරීම හා පාංශු ඛාදනයෙන් ආරක්ෂා කිරීම වැනි පසේ තෙතමනය ආරක්ෂා කිරීම සඳහා පස් වැටි ඉදිකිරීම සෑම ගෙවත්තකම සිදු කොට ඇත. මේවායේ ප්‍රතිඵල ලැබෙන්නේ දිගු කාලීන වශයෙනි. මෙම කටයුත්ත කරනු ලැබුවේ ස්වාභාවික සම්පත් කලමනාකරන ආයතනය විසිනි. පුළුල් ජනතා ප්‍රසාදයක් හා සහයෝගයක් මෙම පස් වැටි ඉදිකිරීමේ වැඩසටහනට ලැබුනි. ස්වාභාවික සම්පත් කලමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ස්වාභාවික සම්පත් කලමනාකරණ ආයතනය **ගොවිජනතාව** උනන්දු කරවීම සඳහා සුළු පරිමාණ මුදල් ගෙවීමක් ද සිදු කරන ලදී. මේ නිසාද මෙම වැඩසටහන සාර්ථකව සිදු විය.

## ජෛව විවිධත්ව ක්‍රියාකාරකම්

ජෛව තාක්ෂණය හා ජෛව විවිධත්ව හා සම්බන්ධ වැඩසටහනක් 1996 සිට **පාම්** ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක කරන ලදී. මුලින් කරනු ලැබූ සමීක්ෂණ තුලින් ප්‍රදේශයට ආවේණික පැහිරි වර්ග කිහිපයක් හඳුනා ගෙන තිබේ. මේ වනතුරු සුදුසු පැහිරි වර්ග ගොවීන් විසින් වගාකර තිබුනේ නැත. පසුව, ප්‍රදේශයට අනුගත වූ බෝගයක් හා පැහිරි වර්ගයක් ලෙස **කුඩළු දෙඩම්** සොයාගනු ලැබීය. **දෙඩම් හා ජම්බෝල වැනි සෙසු පැහිරි වර්ග බද්ධ කිරීම සඳහා කුඩළු දෙඩම් බීජ බණ්ඩාරවෙල ප්‍රදේශීය කෘෂි කර්ම පර්යේෂණ මධ්‍යස්ථානය මගින් නිපදවයි.** **පාම්** ක්ෂේත්‍රය හා වෙනත් ප්‍රදේශ සඳහා ඉහළ ගුණාත්මක බවකින් යුතු පැල වර්ග ලබා දීම සඳහා ක්ෂේත්‍ර පැල තවාන් 4 ක් පිහිටුවීමට පියවර ගෙන ඇත. මේ සඳහා ගොවීන් පුහුණු කර තවාන් ඇති කිරීම සඳහා සුදුසු ප්‍රදේශ ද තෝරාගත තිබේ. බඳුන් හා පැලැටි හිරු එළියට ඔරොත්තු දෙන පරිදි **බඳුන් ආවරණාගාරයක් (Potting sheds)** දේශීය අමුද්‍රව්‍ය යොද ගනිමින් ඉදිකිරීම් කරගෙන යයි. ගොම පොහොර හා එම පොහොර ප්‍රදේශයේ තිබුනද ඒවා භාවිතා කිරීම පිළිබඳ පුරුද්දක් ගොවීන්ට නැති නිසා පැළ තවාන් සඳහා කාබනික පොහොර නිපදවීමේ ආදර්ශනයක් ද පවත්වා ගෙන යමින් සිටී. කිවි (Kew) නම් වර්ගයේ අන්නාසි ඉතා සාර්ථකව මෙම ප්‍රදේශයේ වගා කිරීමට හැකියාව **මහ - ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණායතනය** විසින් සොයාගෙන ඇත. **කිවි (Kew)** ප්‍රභේදයේ අන්නාසි මීට පෙර වගා කිරීමට ගොවීන් උත්සාහ දරා නැත. පටක රෝපන තාක්ෂණය තුලින් පැල 200 ක් පමණ නිපදවා ඒවා ගොවීන් අතර බෙද හැර තිබේ. **පාම්** ක්ෂේත්‍රය තුල ඒවා වගා වෙමින් පවතී.

## බඳුන් ජල සම්පාදන ක්‍රමය මාර්ගයෙන් බෝග වගාව

වර්ෂාපෝෂිත කලාපයන් හි ගොවීන් මුහුණ දෙන ප්‍රධානම ගැටළුව වන්නේ වියළි කාලය තුල තම බෝග ආරක්ෂා කර ගැනීමයි. මෙවැනි වියළි කාල වලදී තම බෝග පැලෑටි බේරා ගැනීම සඳහා නිර්දේශ කරන ක්‍රමයක් වන බඳුන් ජල සම්පාදන ක්‍රමය **පාම්** ක්ෂේත්‍රය තුලට ද හඳුන්වා දීමට පියවර ගෙන ඇත. මේ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නේ සුළු ජල ප්‍රමාණයක් සහ සුළු මුදල් ප්‍රමාණයකි. එමනිසා වියළි කාලයේ ජල හිඟයෙන් තම බෝග නොමැරී ආරක්ෂා කර ගැනීමට මෙම ක්‍රමය යෝග්‍ය වෙයි. බඳුන් ජල සම්පාදන ක්‍රමය ආශ්‍රිතව වගාකල හැකි බෝග ලෙස කෙසෙල්, දෙහි දෙඩම්, පැපොල්, හා අඹ වැනි බෝග හඳුනාගෙන තිබේ.

**දේශීය අමුද්‍රව්‍ය යොද ගනිමින් බඳුන් ආවරණාගාරයක් සකස් කළ හැකි ය.**

බඳුන් ජල සම්පාදන ක්‍රමය පිළිබඳව පුහුණු පාඨමාලාවක් **තිරප්පනේ** ක්ෂේත්‍රයේ දී පවත්වන ලද අතර බඳුන් ජල සම්පාදන ක්‍රම සවිකිරීම එය නඩත්තු කිරීම පිළිබඳව මනා පුහුණුවක් ලබා දී ඇත.

මෙම ක්‍රමය භාවිතයේ දී සෙ.මී. 45 පළල සෙ.මී. 75 දිග හා සෙ.මී. 60 ක් ගැඹුරු වලක් සාදා ගත යුතු වේ. මෙම වලෙන් 1/3 ක් මතුපිට පස් සහ

> **මුට්ටියේ ජලය භාගයක් පමණ අඩු වන විට සෑම විටම එය නැවත ජලයෙන් පිරවිය යුතු වේ.**

කොම්පෝස්ට් දමා පිරවිය යුතුය. මුට්ටිය හා පැලය අතර පරතරය සෙ.මී. 15 වන ආකාරයට පැලය තැබිය යුතු අතර වලේ ඉතිරි කොටස මතුපිට පස් සහ කොම්පෝස්ට් දමා පිරිවිය යුතුය. ඉන්පසු, ප්‍රමාණවත් පරිදි වතුර දමා පස ජලයෙන් පෙහෙවිය යුතුය. මුට්ටිය තුලට කෘමීන්ගේ පැමිණීම වැලැක්වීම සඳහා පොල්කටුවකින් වසා තැබිය යුතුය. මෙම මුට්ටි ජල සම්පාදන ක්‍රමය මගින් පස් තට්ටුව නොකඩවා තෙතමනයක් ඇති කර බෝගය වැඩීමට යෝග්‍ය පරිසරයක් ඇති කරයි. **මුට්ටියේ ජලය භාගයක් පමණ අඩු වන විට සෑම විටම එය නැවත ජලයෙන් පිරවිය යුතු වේ.** මේ සඳහා යොදගන්නා මැටි බඳුන් ධාරිතාවය ලීටර් 10,12 පමණ විය යුතු වේ. මතුපිට රළු විය යුතුය. බඳුනෙහි ජලය පිරවූ පසුව ජලය පිටතට කාන්දු නොවනසේ තීන්ත හෝ සිමෙන්ති අලේප කළ යුතුය. එම අලේප කරන ප්‍රදේශය මුල් බඳුනේ පෘෂ්ඨීය ක්ෂේත්‍ර ඵලයෙන් 3/4 ක් පමණ විය යුතුය. සිමෙන්ති ආලේප නොකල ප්‍රදේශය තුලින් ජලය අවශ්‍ය ප්‍රමාණයට පිටතට විසරණය වී ඒවා පැලැටියට උරා ගැනීමට හැකි වේ.

## ජල පෝෂක කලමනාකරණය

කෘෂිකාර්මික සම්පත් නිසිලෙස කලමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධ කෘෂිකර්මය පිළිබඳ වැඩසටහන හඳුන්වා දී

තිබේ. මෙහිදී සත්ත්ව පාලනය සහ බෝග වගාව සමගාමීව කිරීමට අවශ්‍ය දැනුම අවබෝධය ගොවීන් වෙත ලබා දී ඇත. මෙහිදී ගොවි ප්‍රජාව වෙත වැඩි දියුණු කරන ලද වර්ගයේ එළදෙනුන් 20 දෙනෙකුත් එළුවන් 05 දෙනෙකුත් ගොවි පවුල් 20 ක් අතර බෙදා දෙන ලදී. එළුවන් ලබා ගැනීමට කැමති එක් ගොවි පවුලක් ඒ සඳහා රු.200/=ක මුදලකුත්, ලැබෙන පළමු පැටවා ගොවි සංවිධානය වෙත ආපසු ලබා දෙන කොන්දේසිය යටතේ එළුවන් ලබාදීම සිදු කෙරුණි. මීට අමතරව කිරි හරක් වැඩ සටහනක් ද ආරම්භ කර තිබේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරී කමිටුව විසින් කිරි හරක් ඇති කිරීමට කැමති ගොවීන්ගේ ලේඛනයක් පිළියෙල කොට එම එක් එක් ගොවියාගෙන් රු.3000/= බැගින් ද මුදල් ද එකතු කර **පාම්** වැඩසටහනේ අරමුදල් වලින් **කොට්ටුකච්චිය** ගොවිපලෙන් එළදෙනුන් 10 දෙනෙකු මිලදී ගෙන බෙදා දී ඇත. එමෙන්ම, කාන්තා සංවිධානය විසින් ද නැවත කිරි හරක් 10 දෙනෙකු පමණ මිල දී ගෙන සාමාජික ගොවි පවුල් අතර බෙදා දී තිබේ.

> **ගව සහ එළු ගාල් වලින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය වන ගොම සහ මූත්‍රා කාබනික පොහොර නිපදවීම සඳහා යොදා ගනී.**

මෙම සතුන් රඳවා තැබීම සඳහා අවශ්‍ය ගව ගාල් ඉදි කිරීම ගවයින් නඩත්තු කිරීම වැනි සත්ත්ව පාලන වැඩසටහන සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් **තිරප්පනේ** සත්ත්ව සංවර්ධන උපදේශක කාර්යාලය විසින් ඉටු කර ඇත.

**මෙම ගව සහ එළු ගාල් වලින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය වන ගොම සහ මූත්‍රා කාබනික පොහොර නිපදවීම සඳහා යොදගනී.** කාබනික පොහොර යෙදීම පසේ තෙතමනය රැක ගැනීමට උපකාර වන අතරම පැල වගා කිරීම සඳහා අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ද සපයයි. ඊට අමතරව පස සංරක්ෂණය සඳහා ආවරණ ගස් හා අතුපතර විහිදී යන ගස් මගින් සෝල්ට් වැටි ඉදි කිරීමට ගොවීන් උනන්දු කරවීම සිදු කරයි. මෙම ගස් කුඩා කැබලි වලට කපා සත්ත්ව ආහාර සඳහා යොදා ගැනීමට ද හැකි බව ගොවීන්ට ඒත්තු ගන්වා තිබේ.

## කාන්තා සහභාගිත්වය සහ ස්වයං රැකියා පුහුණුව

**තිරප්පනේ** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාන්තා සංවිධානය අළුතින් ප්‍රකෘතිමත් කිරීම **පාම්** වැඩසටහන යටතේ සිදු විය. මෙහිදී බෝග වගාව, පුහුණු පාඨමාලා, සත්ත්ව පාලන වැඩසටහන් ආදී **පාම්** වැඩසටහන යටතේ සිදු කල විවිධ වැඩසටහන් සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය ලබාගන්නා ලදී. මෙම තත්ත්වය යටතේ කාන්තාවන් ප්‍රජා සංවිධානයක් ලෙස ඉදිරියට පැමිණ ඇති අතර වර්තමානයේ **මාන්නක්කුලම** ග්‍රාම නිලධාරී වසමේ කාන්තා සංගමය තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාන්තා මහා

සංගමයට පවා නායකත්වය ලබාදීම සිදු කරයි. මේ මහින් **තිරප්පනේ** හා අවට ප්‍රදේශවල ද ප්‍රජා සංවර්ධන වැඩ කටයුතු සිදු කරයි. වර්තමාන කාර්ය බහුල ගොවි කාන්තාවට පවුලේ ආර්ථිකයට උරදීමේ වගකීම පහසු කරනු උදෙසා සවයං රැකියා අවස්ථාවන් උදකර දීමට **පාම්** වැඩසටහන යටතේ පහුණු පාඨමාලාවන් ලබා දී තිබේ. ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික සම්පත් ප්‍රයෝජනයට ගෙන ආදයම් උත්පාදන කාර්යයේ නියැලීම සඳහා සත්ත්ව පාලනය, ආහාර සැකසුම්, මී මැසි පාලනය වැනි පුහුණු වැඩසටහන් මාර්ගයෙන් එම අවස්ථා උදකර ගැනීමට අවශ්‍ය දනුම ලබා දී ඇත.

**පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා වෙන්කල කාලය අවසන් වීම, ඒ සඳහා වෙන් කල මුදල් වල සීමිත බව යන කරුණු මත මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සිදුවිය.**

## පාසල් දරුවන් සඳහා පරිසරය පිළිබඳ නව දැනුම

**පාම් වැඩ සටහන ක්‍රියාත්මක කරන ආයතන අතරින් එකක් වූ බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ මූලිකත්වයෙන් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පේරාදෙනිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය, මහඉලුප්පල්ලම කෘෂිකර්ම පර්යේෂණ ආයතනය සහ තිරප්පනේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිළධාරීන්ගේද සහභාගිත්වය ඇතිව ප්‍රදේශයේ දරුවන්ට පාරිසරික දනුමක් ලබාදීම සඳහා පාරිසරික වැඩමුළුවක් මානක්කුලම කණිටු විදුහලේදී පවත්වන ලදී.** මෙම වැඩමුළුවේ දී සිසුන්ගේ වැඩි අවධානය යොමු කරවන ලද්දේ පරිසරයේ වැදගත්කම, කෘෂිකර්මය හා ස්වාභාවික පරිසරය අතර වෙනස, හේන් ගොවිතැන සමහ විනාශ වන වනාන්තර, බෙහෙත් පැලෑටි වලින් එදිනෙද ජීවිතයට ඇති ප්‍රයෝජන ආදිය පිළිබඳවත්, පරිසරය ආරක්‍ෂා කරගැනීමේ දී සිසුන්ගේ කාර්ය භාරයන් පිළිබඳව ය. වැඩ සටහන අවසාන දී පරිසරය පිළිබඳ සිසුන්ගේ දනුම තක්සේරු කිරීම උදෙසා තරඟයක් පවත්වා ජයග්‍රාහකයන්ට සහකාර ප්‍රාදේශීය ලේකම් අතින් ත්‍යාග ලබාදීම ද සිදුවිය. මේ ආකාරයෙන් පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳව බාල පරපුරේ අවධානය යොමු කරවීමට **පාම්** වැඩසටහන ක්‍රියාමාර්ග ගෙන තිබේ.

## කෘෂි ළිං වැඩ සටහන :

භූ ගත ජල මට්ටම ආරක්‍ෂා කර ගනිමින්ම වර්ෂාපෝෂිත ප්‍රදේශයේ ජල සම්පාදන ක්‍රමයක් හඳුන්වා දීම සඳහා ගොවි කණ්ඩායම් කෘෂි ළිං ක්‍රමයක් ඇති කර තිබේ. සුළු ගොවි කණ්ඩායම් දෙකක් සඳහා ව්‍යාපෘති මුදල් යොදවා කෘෂි ළිං දෙකක් ඉදි කර දී ඇත. මෙම කෘෂි ළිං වලින් ජලය සපයා ගනිමින් වැඩි මිලක් සහිත එළවළු, අවාරයේ වගා කිරීම වැනි ඉහල ආදයම් ලබාගැනීම සඳහා පසුබිමක් සකස් කර තිබේ. වැඩි කෘෂි ළිං ප්‍රමාණයක් පෞද්ගලිකව ඉදි කිරීම මාර්ගයෙන් වර්ෂාපෝෂිත ප්‍රදේශයේ භූ ගත ජල මට්ටම වඩාත් පිරිහීමට ලක්වන බව ප්‍රජාවට අවබෝධ කර දෙමින්, ගොවි කණ්ඩායම් සාමූහික වශයෙන් කෘෂි ළිං වලින් ජලය සපයා ගනිමින් බෝග වගා කිරීමට පෙළඹවීම මෙම වැඩපිළිවෙලේ අභිමථාර්ථය යි. භූ ගත ජලය ආරක්‍ෂා කර ගැනීමේ වැදගත්කම එසේම වර්ෂා පෝෂිත ප්‍රදේශයක ජල සම්පත් සාමූහික වශයෙන් භාවිතා කිරීමට ප්‍රජාව උනන්දු කරවීම මෙමහින් බලාපොරොත්තු වේ.

**තිරප්පනේ වැනි ප්‍රදේශයක වර්ෂා පෝෂිත ජලධාරා කළමනාකරණය, පරිසර සංරක්‍ෂණය සහ ආහාර ආරක්‍ෂණය යන සියළුම කාර්යයන් ජනතා සහභාගීත්ව වැඩසටහනක් ලෙස ප්‍රයෝගික ක්‍රියාකාරකම් සහිතව ක්‍රියාත්මක විය.** මෙම වැඩසටහන මහින් **තිරප්පනේ** ග්‍රාමීය ප්‍රජාව ජලධාර කළමනාකරණය සහ සම්පත් තිරසාර ලෙස පාරිභෝජනය කිරීම හා සම්බන්ධව බොහෝ අත්දකීම් ලබාගත් බවට සැකයක් නොමැත. **පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා වෙන්කල කාලය අවසන් වීම, ඒ සඳහා වෙන් කල මුදල් වල සීමිත බව යන කරුණු මත මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සිදුවිය.** මෙවැනි ව්‍යාපෘති පිළිබඳ තවදුරටත් පුළුල් ලෙස හා දිගුකාලීනව පර්යේෂණ පැවැත්වීම අවශ්‍ය බව අවසාන වශයෙන් සඳහන් කළ යුතු වන්නේ ය.

**ආර්.එල්.එන්. ජයතිස්ස**

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**

**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය